# දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 12 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ ඇතුළත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දිවුලපිටිය ප්‍රාදේශිය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2010 වර්ෂයේ හතරවන කාර්තුවේ එකතු කර ඇති ``එකතු කළ අගය මත බදු`` රු.111,318 සඳහා රු.172,783 ක ණයහිමි වෙන්කිරීමක් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබූ ස්ථාවර වත්කම් ශේෂවල එකතවේ හා ප්‍රාග්ධන යෙදමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර, රු.219,381 ක වෙනස නිවැරදි කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ කාර්යාල උපකරණ වල වටිනාකම වූ රු.52,050 ක ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ගොඩනැගිලි සඳහා ගෙවා තිබූ 1% ක ජාතිය ගොඩනැගීමේ බද්ද සහ අඩු කර ගෙන තිබූ 10% ක රැඳවුම් මුදල් එකතුව වූ රු.110,990 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) ඉදි කිරීම් 3 ක් වෙනුවෙන් ගෙවා තිබූ රු.167,672 ක ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඊ) ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ සේවක ණය උපලේඛනයෙ කේවල ශේෂ 07 ක එකතුව රු.495,313 ක් වූ අතර, සේවක ණය ලේඛනයෙ එම ශේෂයන්ගේ එකතුව රු.486,073 ක් වුයෙන් ණය ශේෂවල වෙනස්කම් අනාවරණය විය.

(උ) 2010 දෙසැම්බර් මස හිඟ ආදායම් ප්‍රකාශය සහ ශේෂ පත්‍රයේ ආදායම් ණය ගැතියෝ අතර රු.6,831,574 ක වෙනසක් අනාවරණය විය.

(ඌ) 2008 අංක 05 දරන පළාත් පාලන ආයතන වෙත මුල්‍යාධාර සැපයීම සඳහා වු ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර මුද්දර ගාස්තු වලින් අඩුකිරීමේ පදනම මත පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) ලබාදී තිබු රු.11,625,827 ක මුල්‍ය ආධාර ගිණුම් ගත කර නොතිබුණ අතර, 2008 ජනවාරි සිට ජුනි දක්වා ලැබීමට නියමිතව තිබු රු.4,518,424 ක මුද්දර ආදායම එකී මුල්‍යාධාර වලට හිලව් කර තිබු නමුත් ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(එ) කොම්පෝස්ට් බැරල් මිලදී ගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබු රු.100,000 ක තැන්පත් ගිණුමට ගිණුම්ගත කර තිබියදී මිලදී ගෙන තිබු බැරල් සඳහා වු රු.287,500 ක වියදමින් අදාළ කොටස තැන්පත් ගිණුමට අය කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඒ) 2010 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට අදාළව ලැබිය යුතු මන්ත ප්‍රතිපූර්ණ රු.233,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) තැන්පත් ලේඛනයේ රු.527,817 ක වටිනාකම නියෝජනය කරමින් සටහන්ව තබූ එකතු කළ අගය මත බදු තැන්පත් සහ 10% අතරැඳවුම් මුල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව නොතිබුණි.

(ඕ) රු.1,381,410 ක පොදු ගබඩා, ක්ෂේත්‍ර ගබඩා සහ විදුලි ගබඩා තොගය ගිණුම් ගත වී නොතිබුණි.

(ක) 2010 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.25,300 ක් වු ඉතිරි කොම්පෝස්ට් බැරල් 11 ක වටිනාකම ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ග) මුල්‍ය ප්‍රකාශන අනුව විදුලි ගබඩා තොග ශේෂය හා තොග පොතේ දැක්වෙන ශේෂය අතර, රු.10,159 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ච) කර්මාන්ත වෙනුවෙන් අඩුකර ගෙන තිබූ රු.1,298,139 ක 10% රැඳවුම් මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ජ) 2010 වර්ෂයේ මහ නැගුම වැඩ සටහන යටතේ නිමකර ගෙවීම් කර තිබූ ව්‍යාපෘති 3 කට අදාළ රු.1,180,000 ක් හා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් ලැබිය යුතු මූලධන ආධාර යටතේ ගෙවා නිම කර තිබූ ව්‍යාපෘති 6 කට අදාළ රු.666,769 ක් ණය ගැති ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 04 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.31,824,538 ක්වූ අතර ඒවාට අදාළ උපලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.23,030,591 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.2,482,808 ක් විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.95,301,392 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත</u><br>24(1) (අ) වගන්තිය | යොමුගත වගන්තියේ නියමයන්ට අනුකූලව පවත්වා ගෙන යනු ලබන මාර්ග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. 2002 පෙබරවාරි මාසයට පසු සභාවේ මාර්ග ගැසට් පත්‍රය මගින් ප්‍රකාශ කර නොතිබුණි. |

(ආ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | 5(5) රීතිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ii) | 19 රීතිය | සියළුම උප පත්‍රිකා පොත් ලේකම් භාරයේ තැබිය යුතු වුවත්, සභාවේ උප පත්‍රිකා පොත් ගබඩා භාර නිලධාරී භාරයේ තිබුණි. |
| (iii) | 31 රීතිය | චෙක්පත් අගරු වූ විට චෙක්පතේ වටිනාකම මුදලින් ගෙවන ලෙස අදාළ පුද්ගලයින්ට දැන්විය යුතු වුවත්, වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.158,260 ක්වූ අගරු චෙක්පත් පිළිබඳව එසේ කටයුතු කර නොතිබුණි. |
| (iv) | 59 රීතිය හා 60 රීතිය | සෑම වර්ෂයකම ආරම්භයේදී බලය ලැබූ නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දිනට පෙර සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. |
| (v) | 169 (3) රීතිය | වැඩ පිළිබඳ කාර්යභාර නිලධාරී විසින් පී.එස්.42 ආකෘතිය ප්‍රකාර ගල් බොරළු ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබා ගන්නා ගල්, වැලි, පස් හා බොරළු ආදී ද්‍රව්‍ය සටහන් කිරීම සඳහා මෙවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (vi) | 203 රීතිය | යොමුගත රීතිය ප්‍රකාර සැදුම්ලත් සමීක්ෂණ මණ්ඩලයක් විසින් සභාව සතු දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (vii) | 217 රීතිය | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක පවත්වා නොතිබුණී. |

(viii) 218 රීතිය — යොමුගත රීතිය ප්‍රකාර සැදුම්ලත් සමීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**
---------------------------

(i) මු.රෙ. 110 — හානි හා පාඩු ලේඛනයක් පවත්වා' නොතිබුණි.

(ii) මු.රෙ. 396 (ඇ) — 2010 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවු කල් ඉකුත් වූ වටිනාකම රු.723,042 ක් වූ චෙක්පත් 85 ක් සම්බන්ධයෙන් යොමුගත විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණ.
ලීබඩු මිලදී ගැනීම සඳහා ලියන ලද එහෙත් පසුව අවලංගු කර ඇති රු.452,562 ක් වටිනා චෙක්පතක්ද මේ අතර ඇති බව අනාවරණය විය.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,867,075 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,693,515 ක් විය.

### 2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය සහා ප්‍රධාන කාර්යාලයේ සහ උප කාර්යාල තුනකට අදාළ එකතුව රු.11,480 ක් වු උපලබ්ධි නොවු චෙක්පත් 14 ක් සහ මුදල් ඇණවුම් 11 ක් පිළිබඳ පසු විපරම් කර නොතිබුණි.

(ආ) 1991 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 11 කදී නියමිත වටිනාකමට වඩා වැඩිපුර අගයකට චෙක්පත් ලිවීම නිසා සිදුව තිබු රු.7,282 ක

ඌණතාවය වගකිවයුතු අයගෙන් අයකර නොගෙන බැංකු සැසඳුමේ ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ඇ) බැංකු ගිණුම් වල සෘජු බැරකිරීම් රු.1,000 ක් සහ හර කිරීම් රු.227 ක් හඳුනා ගෙන නොතිබුණි.

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස මගේ 2011 පෙබරවාරි 07 දිනැති අංක ඩබ්ළිව්/පපා/වි.වා/2011/01 දරන ලිපියෙන් සභාපතිවරයාගෙන් ඉල්ලා තිබුණද, එකී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3.2 <u>හිඟ වරිපනම් බදු</u>

2010 දෙසැම්බර් මාසය වන විට හිඟහිටි වරිපනම් බදු රු.10,947,925 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158(1) වගන්තියේ නියමයන්ට අනුව අයකර ගැනීමට සභා ලේකම් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.3 <u>හිඟ අක්කර බදු හා වෙනත් ආදායම්</u>

2010 දෙසැම්බර් මාසය වන විට හිඟහිටි අක්කර බදු, හිඟ හිටි විනෝද බදු, කර්මාන්ත හා ව්‍යාපාර බදු, වෙළඳ ස්ථාන කුලී සහ බදුකර සහ වෙනත් හිඟ ආදායම් එකතුව රු.10,424,914 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 159(1) වගන්තියේ නියමයන්ට අනුව අයකර ගැනීමට සභා ලේකම් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 <u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් | 000` | 000` | 000` | 000` | 000` | 000` |
| පෞද්ගලික පඩිනඩි | 39,962 | 34,417 | 5,545 | 39,599 | 34,662 | 4,937 |
| අනෙකුත් | 14,202 | 23,338 | (9,136) | 12,956 | 18,862 | (5,906) |
| උප එකතුව | 54,164 | 57,755 | (3,591) | 52,555 | 53,524 | (969) |
| ප්‍රාග්ධන වියදම | 62,150 | 38,731 | 23,419 | 22,025 | 31,533 | (9,508) |
| මුළු එකතුව | 116,314 | 96,486 | 19,828 | 74,580 | 85,057 | (10,477) |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතියික | 26 | 20 |
| ප්‍රාථමික | 123 | 108 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 06 |
| එකතුව | 151 | 136 |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව ඇති භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වු විස්තර පහත දැක්වේ. ඒවායේ වටිනාකම පිළිබඳ තොරතුරු පොත්පත්වල සටහන්ව නොතිබුණි.

| | අයිතමය | නශ්ක්‍රීය කාලය අවුරුදු |
|---|---|---|
| (i) | මඩම්පැල්ල පොදු වෙළඳ පොල ගොඩනැගිල්ල | 1 ට වැඩි |
| (ii) | යන්මාර් අත් ට්‍රැක්ටරය | 3 ට වැඩි |
| (iii) | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | |
| (iv) | කෝලාස් ඉසින යන්ත්‍රය | |

### 2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතව රු. 8,242,374 ක් වූ අතර, විෂයයන් 03 කට අදාළව පසුගිය වර්ෂ වල සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් තිබෙන ශේෂ වල වටිනාකම රු.161,672 ක විය.

### 2.6.3 අයවීමට ඇති සේවක ණය

වර්ෂ ගණනාවක සිට සේවකයන් 15 දෙනෙකුගෙන් අය නොවී තිබෙන සේවක ණය රු.268,224 ක් සඳහා ණය ලබා ගත් අයගේ තනතුරු, ණය අය නොවීමට හේතුව, කාල විශ්ලේෂණය සහ ණය වලට අදාළ ලිපි ගොනු යනාදිය විගණනයට ඉදිරිපත් නොවුණි.

### 2.6.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.101,092 ක් විය. වටිනාකම ලබා ගත නොහැකි ප්ලාස්ටික් පටු 30 ක් හා ප්‍රධාන වහරු (main switch) දෙකක්ද අචල ජංගම වත්කම් අතර විය.

### 2.6.5 සමීක්ෂණය නොකළ වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු.80,167,351 ක් විය.

### 2.7 හඳුනාගත් පාඩු හා හානි

(අ) භෞතික පරීක්ෂණ වලදී අනාවරණය වූ තොරතුරු සහ සභාව පවත්වා තිබූ තොග පොත්වල ශේෂ අනුව රු.1,157,162 ක විදුලි උපකරණ ඌනතාවයක් අනාවරණය විය.

(ආ) 2000 වර්ෂයේදී සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණ රු.200,000 ක් වටිනා අංක 74-4130 දරන අත් ට්‍රැක්ටරය 2003 ඔක්තොබර් 10 දින අනතුරකට භාජනය වී තිබූ අතර, ඒ සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීමට හා අනතුරට වගකිවයුතු පාර්ශවයන් ගෙන් අලාභය අයකර ගැනීමට අදාළව මූලික විමර්ශන කටයුතු කර නොතිබුණි.

(ඇ) විදුලි ගබඩා තොග ලේඛනය අනුව විදුලි උපකරණ තොග ශේෂයන්ගේ රු.551,035 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

### 2.8 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභා මන්ත්‍රීවරුන්ට 2010 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ නිශ්චිත ප්‍රතිපාදන නොතිබියදී වටිනාකම රු.6,744 ක්වූ ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ නිකුත් කර තිබුණි.

(ආ) පෞද්ගලික දුරකථන සමාගමකින් ලබාගත් රැහැන් රහිත දුරකථන 10 කට සහ ඒවායේ බිල්පත් පියවීම පිණිස වර්ෂය තුළ රු.107,490 ක් වැය කර තිබූ අතර, මෙම දුරකථන සභාවේ පොත් පත් වලට ඇතුළත් කර නිශ්චිත නිලධාරීන්ට භාරදී නොතිබුණි. මේ වන විට දුරකථන පහසුකම් ඇති කොටදෙණියාව හා කෙසෙල්ඇල්ල උප කාර්යාල දෙකකට දුරකථන දෙකක් ලබාදී තිබූ අතර, මහජන පුස්තකාල 07 කට සහ මරදගහමුල ආදාහනාගාරයට දුරකථන සපයා තිබුණද, අවශ්‍යතාවයන් පිළිබඳ විගණනයට තොරතුරු ඉදිරිපත් නොවුණි.

(ඇ) පෞද්ගලික තක්සේරුකරුවෙකු ලෙස හඳුන්වන පුද්ගලයකු විසින් 2009 වර්ෂයේදී කෙහෙල්ඇල්ල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් විශේෂ ව්‍යාපාරික ස්ථාන තක්සේරු කිරීමෙන් පසු ඉදිරිපත් වූ විරෝධතා නැවත පරීක්ෂා කර වාර්ෂික

වටිනාකම 91% ක් තරම් අසාමාන්‍ය ප්‍රතිශත වලින් අඩු කර සංශෝධිත තක්සේරු වාර්තා ලබාදී තිබුණි. මෙම තක්සේරු කරුට තක්සේරු කටයුතු පිළිබඳ වෘත්තිය සුදුසුකමක් ඇති බව තහවුරු කර ගෙන නොතිබු අතර, මේ ආකාරයට අසාමාන්‍ය ලෙස වාර්ෂික වටිනාකම අඩු කිරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

## 2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2010 නොවැම්බර් වන විට වලංගු කාලය ඉක්ම ගිය පරිසර බලපත්‍ර 47 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර ව්‍යාපාර අනවසරයෙන් පවත්වා ගෙන යාමට එරෙහිව නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි.

(ආ) මහජන පැමිණිලි ලේඛනයක් පවත්වා නොතිබුණ අතර, මහජන පීඩාවන් සම්බන්ධව ප්‍රදේශවාසීන්ගෙන් සභාවට ලැබී තිබුණු පැමිණිලි 03 ක් සම්බන්ධව වර්ෂය අවසානය වන විටත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) හුණමුල්ල නාවික ගම්මානයේ පිවිසුම් මාර්ගයේ ඇතිරීම සඳහා පුද්ගලික ආයතනයකින් මිලදීගෙන තිබු කොන්ක්‍රීට් ගඩොල් 33,000 ක වෙනුවෙන් වැය කර තිබු තථ්‍ය වියදමට වඩා රු.41,250 ක් වැඩියෙන් මහා මාර්ග අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

(ඈ) සභාවේ නිල කාලය අවසන් වීමට ආසන්නව තබියදී මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා යොමුකර එම පාඨමාලාවේ ගාස්තුව වන රු.80,000 ක් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් පියවා තිබුණි.

(ඉ) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනත අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බද්දෙන් 33 ⅓% ක් රඳවා ගෙන සෘජුවම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් වර්ෂය තුළදී රු.100,708 ක් ඒ ආකාරයට රඳවාගෙන හෝ ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.10 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) නාවාන පුවක්වත්ත පාර, මහගම හල්පෙ නරියමුල්ල පාර, කුඩගම්මන බාදුරාගාඩ පාර හා රාස්සපාන රවුම් පාර මෝටර් ග්‍රේඩර් කිරීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට රු.15,600 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

(ආ) දිවුලපිටිය හොරගස්මුල්ල පාර උළු කඩේ හන්දිය අසලින් 12 කණුව දක්වා වූ මාර්ගය පලුදු මකා තාර දැමීම සඳහා කාර්මික නිලධාරී වෙත වටිනාකම රු.205,769 ක් වූ ගල් වැලි හා තාර ගබඩාවෙන් නිකුත් කර රු.21,250 ක කම්කරු වැටුප්ද ගෙවා තිබුණි. එසේ වුවද, ව්‍යාපෘතියෙන් කොටසක් පමණක් නිම කර ඇති බව කාර්මික නිලධාරී විසින් සභාවට වාර්තා කර තිබුණි.

(ඇ) දූනගහ ඉදුරාගාර වෙල මැද පාර පලුදු මකා තාර දැමීම සඳහා කාර්මික නිලධාරී වෙත රු.183,900 ක ගල්, වැලි හා තාර නිකුත් කර රු.31,100 කම්කරු වැටුප්ද ගෙවා තිබූ අතර, කාර්මික නිලධාරී වාර්තාව අනුව නිමකළ වැඩ වල වටිනාකම රු.149,928 ක් වුයෙන් රු.65,072 ක්වූ ද්‍රව්‍ය අව[illegible]ාවිතව ඇති බවක් නිරීක්ෂණය විය. සභාව විසින් රු.400,000 ක ඇස්තමේන්තුවක් මත මෙම මාර්ගයේ පලුදු මකා තාර ආස්තරණය කිරීම ආරම්භ කරමින් සිටින අතරතුර බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියද එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම නිසා සභාව විසින් වැය කරන ලද රු.285,210 ක මුදල අනාර්ථික වැයක් බවට පත්ව තිබුණි.

(ඈ) දිවුලපිටිය කුරුණෑගල පාර පරණ හන්දියෙන් දකුණට නාවාන පුවක්වත්ත මාර්ගයේ අබලන් වූ කොටස තාර දමා පිළිසකර කිරීම සඳහා කාර්මික නිලධාරී වෙත රු.424,645 ක වටිනාකමට කළුගල් සහ තාර නිකුත් කර තිබුණද, කාර්මික නිලධාරී වාර්තා අනුව භාවිතා කරන ලද ද්‍රව්‍ය වල වටිනාකම රු.226,852 ක් වුයෙන් රු.197,793 ක කළුගල් සහ තාර අවභාවිතව ඇත බවක් නිරීක්ෂණය විය.

(ඉ) මීගමව මීරිගම මාර්ගයේ මිල් කාසල්වත්ත පළමු පටුමග පලුදු මකා තාර දැමීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩියෙන් රු.14,050 ක් වටිනා කළුගල් කියුබ් 3.44 ක් නිකුත් කර තිබූ අතර, වැඩියෙන් නිකුත් කළ ද්‍රව්‍ය කාර්මික නිලධාරී විසින් ගබඩාවට භාරදී නොතිබුණි.

(ඊ) මරදගහමුල ගොවිජන සේවා මධ්‍යස්ථානය අසලින් වූ මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ග්‍රාම සංවර්ධන සමිතියකට රු.302,648 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා කාර්මික නිලධාරීගේ නිර්දේශයක් නොතිබුණ අතර, සභාවේ අධීක්ෂණය යටතේ මෙම කාර්ය සිදුවූ බවට තොරතුරු ඉදිරිපත් නොවුණි.

## 2.11 <u>අභ්‍යන්තර විගණනය</u>

අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණද, සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) මූල්‍යපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඉ) තොග පාලනය